# මාතර තාරකාකොටුවේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබඳඅධ්‍යයනයක්

ආර්.කේ.එන්. සුභාෂිනී

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
nadeeshasubhashini10@gmail.com

ප්‍රමුඛ පදඃ තාරකා බලකොටුව, වාස්තුවිද්‍යාත්මක, ලක්ෂණ, ලන්දේසි

## හැදින්වීම

ශ්‍රී ලාංකීය අභිමානය ලොවට විදහා දක්වන අසමසම නිර්මානයන්හි නටබුන් අදටද අනුරාධපුරයේ හා පොළොන්නරුවේ යුගතුළ දැකගත හැකිය. විවිධ වාස්තුවිද්‍යාත්මක නිර්මාණයන් කිරීමට ලාංකිකයා දක්ෂ වූ අතර කාලයත් සමඟ නවාංගවල එකතුවක් ලෙස අලංකාර ගොඩනැගිලි නිර්මාණය කෙරිණ. මෙම අංගයන්හි විකාශනයේ සුවිශේෂී ස්ථානයක් ලෙස යුරෝපීයන්ගේ අවධානය ලංකාවට යොමු වූ කාල පරාසය වැදගත් වේ. ඒ අතරින් ලන්දේසින් යටතේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය වූ අවධියේදී ඉදිවූ ගොඩනැගිලි ලන්දේසි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ කදිමට නිරූපනය කරයි. ඒ අතරින් මාතර තාරකා බලකොටුවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික් නගර මධ්‍යයේ නිල්වලා ගඟට යාර 200ක් උතුරින් පිහිටි වාස්තුවිද්‍යාත්මක අතින් සුවිශේෂී මෙම ගොඩනැගිල්ල ක්‍රි.ව 1656දී මෙරට මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගත් ලන්දේසින් ස්වකීය බලය තහවුරු කරගැනීම සඳහා ඉදිකර ඇත. සිංහල ජන විරෝධය මත ලන්දේසින්ට එක්වරක් මෙම බලකොටුව අහිමිවන අතර ක්‍රි.ව 1762 දී වැන්එක් ආණ්ඩුකාරවරයා යටතේ අත්පත් කරගෙන එහි ආරක්ෂාවට ක්‍රි.ව 1763 දී පිටතින් තාරකා කොටුව ඉදිකරන ලදි. 1796 දී මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගත් බ්‍රිතාන්‍යයන් මෙහි මුල් ස්වරූපය වෙනස්කරන අතර 1914 දී අයර්ටන් එහි යනවිට තිබී ඇත්තේ නව ඉදිකිරීමකි. ඒ අනුව ලන්දේසි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ ඔප්නංවන අයුරින් අදටත් මාතර තාරකාකොටුව විද්‍යාමාන වේ.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ලෙස ද්විතියික මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමුකරන ලදි. ඒ අනුව සාහිත්‍යමූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මඟින් දත්ත එක්රැස් කරන ලදි. සාහිත්‍යමූලාශ්‍රය වශයෙන් තාරකාබලකොටුව පිළිබඳ ලියවුන විද්වතුන්ගේ ග්‍රන්ථ පරිශීලනය කරන අතර ක්ෂේත්‍ර අධ්‍යනය කිරීමෙන්ද දත්ත රැස් කරගනු ලැබූ දත්ත ද මේ සඳහා උපයෝගි කර ගන්නා ලදි.

## ප්‍රතිඵල හා සාකච්ජාව

ලන්දේසි ජාතිකයන්ගේ අනන්‍යතාවය පිළිබිඹු කරන මාතර තාරකා බලකොටුවෙහි වාස්තුවිද්‍යාත්ම සැලැස්ම ප්‍රධාන කොටස් 2ක් යටතේ අධ්‍යනය කලහැකිය. ඒ අභ්‍යන්තර හා බාහිර වශයෙනි. බාහිර සැකැස්ම යටතේ ප්‍රවේශය, පිටත ප්‍රාකාරය හා දියඅගල, ආයුධ කවුළුව මෙන්ම ආරක්ෂක පවුරුව හා පාලම යන කොටස් අන්තර්ගත වේ. අභ්‍යන්තර සැකැස්ම යටතේ ලන්දේසින්ගේ වෙඩිබෙහෙත් ගබඩාව, සොල්දාදුවන්ගේ කාමර ගබඩා කාමර දැකගත හැකි අතර ඔවුන් භාවිත කළ කාර්යාලය, ළිඳ හා විවෘත මිදුල යන කොටස් ඇතුලත්වේ.

තාරකා බලකොටුවෙහි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අතර මෙහි ආරක්ෂාවට පසුව එක්කරන ලද පිටත ප්‍රාකාරබැම්ම සුවිශේෂීය. තාරකාවක හැඩයට නිර්මාණය කරන ලද ප්‍රාකාර බැම්ම නිසා "තාරකාකොටුව" නමින් එය ව්‍යවහාර වේ. නමුත් පිටත දොරටුව ඉහළින් VOC (VEREENGDEOST COMPNIE UNITED EAST INDIA MPANY)යන්න ලියා ඇත. එක්සත් පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම යන්න එහි අරුතවේ. ඊට යටින් සිංහයන් දෙදෙනකු සහිත ලාංජනය හා ආණ්ඩුකාරවරයාගේ නාමය වූ " VANECK" ලෙස සදහන්කර ඇත කොටුවෙ නාමය ලෙස "ආරක්ෂාව" යන අරුත ඇතිව REDDOUTE VANECK ලෙසද 1763 වර්ෂය ද සඳහන් කර ඇති අතර ආණ්ඩුකාරවරයාගේ මුල් අකුරු L.I.V.E ලෙස සඳහන් කර ඇත. මෙහි ප්‍රවේශය අඩි 200ක් පමණ දිගින්යුතු වේ. ප්‍රවේශ මාර්ගය රේඛීයව දකුණේ සිට ඇතුල්වීමේ දොරටුව දක්වා විහිදී ඇත. බලකොටුවේ පිටත බෑවුම අගලක් සේ කපා පුළුල් හා ශක්තිමත් අයුරින් නිර්මාණය කර ඇත. ප්‍රවේශය කෙළවර වනුයේ දිය අගලකිනි.

මෙහි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ විදහාදක්වන තවත් අංගයක් ලෙස ඉදිරිපස සකස් කරඇති පාලම දක්වියහැකි ය. දියඅගල හරහා බලකොටුව වෙත ගමන්කිරීම සඳහා දැවයෙන් නිර්මාණය කර ඇති මෙම පාලම ප්‍රධාන කොටස් 2කට බෙදා තිබේ. ප්‍රධාන දොරටුව සමීපයේ ඇති දෙවැනි කොටස හැකිලිය හැකිසේ ලීවර ක්‍රමයට ගොඩනගා ඇත. මෙය ක්‍රියාත්මක කළ හැක්කේ ප්‍රධාන දොරටුවේ ඇතුළු පැත්තේ සිටපමණි. දොර වැසූපසු ආරක්ෂිත දොරක් සේ එය ක්‍රියාත්මක වේ. එමගින් බලකොටුවට ඇතුළුවන ප්‍රධාන දොරටුව දෙපසින් තවත් දොරටු දෙකක් වැසේ ඒ අනුව කොටුවට ඇතුල්වීමේ දොරගුළු වැසේ.තවද ස්මාරකය වටා ඇති දිය අගල වාස්තුවිද්‍යාත්මක අතින් සිත් අදගනී. දිය අගලෙහි ගැඹුර අඩි 10ක් පමණ වන අතර පළල අඩි 20 ක් පමණ වේ. අතීතයේ දිය අගල ජලය පුරවා කිඹුලන් වැනි සතුන් යොදා ආරක්ෂිත වළල්ලක් ලෙස නිර්මාණය කර තිබෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. පිටත බෑවුමේ හා කොටු පවුරේ ආනතියක් සහිතව බිත්ති කපරාරු කර දියඅගල සකස් කරඇත. මින් ගම්‍ය වන්නේ ලන්දේසි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණවල මහිමයයි. බලකොටුව වටා අඩි 25ක් පමණ පළලින් යුතු පිටත බෑවුම දකගත හැකි අතර, දිය අගලේ පත්ලේ සිට ගොඩනැගූ අඩි 10ක් පමණ උස්වූ බැම්මෙන් පිටත බෑවුම රදවා තිබේ.

තවද මෙහි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අතර කොටු බැම්ම ඉතා සුවිශේෂිය. අඩි 14ක් ඝනකමින් යුත් එහි උස අඩි 13කි ඉන් ඉහළට අඩි 3ක් පමණ උස්වූ ආරක්ෂණ පවුරක් නිර්මිතය. බහුඅශ්‍රකෝණිකව අට්ටාල සහිතව ආරක්ෂාවෙන් අනූනව ගොඩනගා ඇති තාරකාකොටුව කොන් 6කින් හා පැති 12 කින් යුක්ත වේ. එක් මුහුණතක් අඩි 48 ක් දිගින් යුතු වන අතර ඇතුල්වන දොරටුව දෙපස ඇති මුහුණත් 2 අඩි 40 බැගින් වේ.

එසේම එල 2කින් යුතුව නිර්මාණය කර ඇති ප්‍රධාන දොරටුව යකඩ සොයිබයක ආධාරයෙන් අගුල් දැමිය හැකිය. දැව පාලම හැකිලූ පසු මෙම ප්‍රධාන දොරටුව දොරවල් 2කින් ආවරණය වේ. එවිට එහි දොරටු සංඛ්‍යාව 3කි ප්‍රධාන දොරටුවෙන් ඇතුල්වන විට දෙපස ආරුක්කු හැඩයේ කුටි දෙකකි. මෙය වෙඩි බෙහෙත් ගබඩා ශාලාවක් ලෙස භාවිත වූ බව සාහිත්‍යාත්මක මූලාශ්‍රවල සඳහන් වේ. වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ඔප්නැංවෙන අංගයක් ලෙස කාලතුවක්කු කවුළුව හා වේදිකාව දක්විය හැකිය. පැත්තක කාල

තුවක්කු කවුළුව බැගින් බලකොටුවේ කාල තුවක්කු කවුළු 12කි. ප්‍රාකාර බැම්මේ සියලු දිශාවන් ආවරණය වන පරිදි ස්ථානගත කළ හැකි ලෙස කවුළු හා වේදිකා සකස් කර තිබේ. වෙඩි බෙහෙත් ගබඩාවලට සම්බන්ධ දෙපැත්තෙන් ඉහලට යෑමට ප්‍රවේශය සකසා ඇත. කාලතුවක්කු කවුළු ඇතුළු පැත්ත අඩි 4ක් ද පිටත විවරය අඩි 10 ක්ද වන පරිදි ක්‍රමයෙන් පුළුල් වන ලෙස නිර්මාණය කර තිබේ, ගැඹුර අඩි 11 කින් යුතු මෙහි තුවක්කුව තබන වේදිකාවේ සෑම පැත්තක්ම අඩි 30 බැගින් වේ.

ලන්දේසි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹුවන තාරකා බලකොටුවේ මැදමිදුල හා ගොඩනැගිල්ල ජනයාගේ සිත් ඇද ගැනීමට සමත්ය. සමතලා බිමෙහි විශාල ඉඩක් අහුරාගත් ගොඩනැගිල්ලකි. ඒ මධ්‍යයේ කුඩාමැද මිදුලකි. මැදමිදුලට මුහුණලා සොලිදාදුවන්ගේ කාමර, ආණ්ඩුකාරයාගේ කාර්යාලය, ගබඩා ආදියෙන් යුක්තව වළල්ලක් ආකාරයෙන් නිමවා ඇති මැදමිදුලෙහි හරිමැදින් අඩි 9ක විශ්කම්භයකින් යුතු ව ළිඳක් නිර්මාණය කර ඇත. එය ලන්දේසි ගෘහනිර්මාණ ශිල්පයේ සුවිශේෂි අංගයකි. මැද මිදුලේ සහ ඉහළ වේදිකාවේ එක්වන ජලය ත්‍රිකෝණාකාරව සැකසූ භූගත ජලප්‍රවාහන ක්‍රමයකින් දියඅගලට එක්වන බැවින් දියඅගල නිතර පිරීපවතී. ඉතා කුඩා වපසරියක් භාවිත කරමින් නිර්මාණය කර ඇති කුඩාබලකොටුවක් වන තාරකා බලකොටුව එහි වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් තුළින් ලන්දේසින්ගේ වාස්තුවිද්‍යාත්මක කෞශල්‍ය මනාව පිළිබිඹු කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


අලහකෝන්, වසන්තා. (2017)*මාතර තාරකා කොටුව කෞතුකාගාරය*පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පෙරේරා, තිස්ස. (2011)*ශ්‍රී ලංකාවේ ලන්දේසි බලකොටු*. සූරිය ප්‍රකාශකයෝ

විජේතුංග, සිරිසමන්. (1999)*අසිරිය පැරණි රුහුණ*.පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.